# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1770/26 - 2012 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2012.08.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2012 අගෝස්තු මස 13 වැනි දින සිට ආරම්භ වන මාස 04ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2012.07.13 දිනැති අංක 1766/35 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් අර්තාපල් (සංයෝජිත වර්ගීකරණ අංක 0701.90) බොම්බයි ළූනු (සංයෝජිත වර්ගීකරණ අංක 0703.10.20) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2012 අගෝස්තු මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 අගෝස්තු මස 10 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු. 30.00 |
| 2. | 07.03 | 0703.10.20 | බොම්බයි ළූනු | කි. ග්‍රෑමයට රු. 50.00 |

08-880


1A - G 016440— 355 (2012/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.